# අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනය (USAID) පොළොන්නරුවේ කිරි ගොවීන්ට කිරි අලෙවිය වැඩි කර ගැනීමට ආධාර කරයි

**පෙබරවාරි 19,2016:** කිරි ගොවීන්, සීඅයිසී ඩෙයරීස් හා මිල්ක් ඉන්ඩස්ට්‍රීස් ඔෆ් ලංකා (පුද්) සමාගම අතර පෙබරවාරි 18 වැනිදා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමේ අවස්ථාවට එක්සත් ජනපද තානාපති කාර්යාලයේ හා ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෝ සහභාගි වූහ. මෙම ගිවිසුම නිසා පොළොන්නරුවේ කිරි ගොවීන්ට ඔවුන්ගේ කිරි අලෙවිය වැඩි කර ගැනීමට හැකි වනු ඇත. අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයේ (USAID) වැඩබලන අධ්‍යක්ෂ රීඩ් එයිෂ්ලීමන් හා ග්‍රාමීය කටයුතු අමාත්‍ය පී. හැරිසන් ද මෙම අවස්ථාවට සහභාගි විය. මෙහි දී අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයෙන් කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීමට ප්‍රයෝජනවත් වන උපකරණ ද ගොවීන්ට බෙදා දෙන ලදී.

මෙය එක්සත් ජනපද-ශ්‍රී ලංකා සහයෝගීතාව තුළින් මේ රටේ ජනතාවගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීම පිළිබඳ තවත් එක් උදාහරණයකි“ යි එක්සත් ජනපද තානාපති අතුල් කෙෂාප් ප්‍රකාශ කළේය. “කිරි සඳහා පොළොන්නරුවේ විශ්වාසී මූලාශ්‍රයක් පිහිටුවීමෙන් ගොවීන්ට මෙන් ම කිරි සමාගම්වලට ද වාසි සැලසෙනු ඇත.“

කිරිපට්ටි කළමනාකරණයේ නවතම භාවිතයන් ගැන ගොවීන් පුහුණු කිරීමටත්, ගුණාත්මක ප්‍රමිතිවලට අනුව කිරි නිෂ්පාදනය කරන අයගෙන් දිනකට දෙවරක් කිරි එකතු කිරීමේ ගම් මට්ටමේ ශීතකරණ පද්ධති පිහිටුවීමටත්, අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය ආධාර කරයි. අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව අඩු ම වශයෙන් අවුරුදු දෙකක් කිරි ගොවීන්ගේ වැඩිපුර නිෂ්පාදනය, සීඅයිසී ඩෙයරීස් හා මිල්ක් ඉන්ඩස්ට්‍රීස් ලංකා (පුද්) සමාගම විසින් මිල දී ගනු ඇත.

මෙහි දී හැරිසන් ඇමතිතුමා කියා සිටියේ “ ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය දියුණු කිරීමට කර ඇති කැපවීම ගැන අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයට (USAID) ස්තුති කරන බවත්, උතුරේ හා මෙම කලාපයේ කර ඇති කටයුතු ඉතා අගේ කරන“ බවත් ය.

උතුරේ , නැගෙනහිර හා උතුරු මැද පළාත්වල ගොවි තැන වැඩිදියුණු කිරීමටත් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමටත්, අවස්ථා හා ජීවිකා සංවර්ධනයට ආධාර කිරීමේ ව්‍යාපෘතිය (SOLID) යටතේ පවුල් 3000ක ආදායම් වැඩි කිරීමටත් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද (USAID) ආයතනය, සහාය වේ. මෙය ක්‍රියාත්මක කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජයේත්, පළාත් පාලන ආයතනවලත්, පුද්ගලික අංශයේත් සහයෝගයෙනි. ආධාර ලබා දීමේ දී ස්ත්‍රී මූලික නිවාස, යුද වැන්දඹුවන් හා නැවත පදිංචි කළ පවුල් වලට ප්‍රමුඛත්වයක් ලබා දීමට විශේෂ උත්සාහයක් ගනු ලැබේ.

අවතැන් වූ ජනයාගේ ප්‍රතිසාධනය හා නැවත පදිංචිය ප්‍රවර්ධනය කරන, අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද (USAID) ආයතනයේ වෙනත් ව්‍යාපෘති ගණනාවක් එක්සත් ජනපද නියෝජිතයන් විසින් මේ සතියේ පරීක්ෂා කරන ලදී. උතුරු මැද පළාතේ මිදි හා හතු ගොවීන් හමු වූ එයිෂ්ලීමන් මහතා වැල් දොඩම් ගොවීන්ට උපකරණ බෙදා දුන් අතර උතුරු පළාතේ ආපසු පැමිණි ජනයාට කෘෂිකාර්මික වතුර පොම්ප ද බෙදා දුන්නේ ය.